ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC Freelancer ගිණුම

නිමැවුමේ ස්වභාවය

Online මාධ්‍ය ඔස්සේ සේවා සපයන (freelancers, online entrepreneurs) පුද්ගලයන් උදෙසා හඳුන්වා දුන් විශේෂ ඉතුරුම් යෝජනාක්‍රමය කි.

ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ

- ශ්‍රී ලංකා රුපියල් හෝ විදේශ මුදල් වර්ග 7ක් යටතේ ගිණුම් ඇරඹීමේ හැකියාව
- Smart Freelancer PFC/BFC ගිණුම්වල තැන්පතු ශ්‍රී ලංකා රුපියල්වලට මාරුකිරීමේදී විශේෂ වාසි
- තැන්පතු සඳහා අමතර පොලියක්
- බඳවාගැනීමේ ගාස්තු රහිත ක්‍රෙඩිට් කාඩ්පතක්
- Visa Direct හරහා වේගවත් මුදල් හුවමාරුව
- අන්තර්ජාල බැංකුකරණ පහසුකම/ Smart පාස්පොත් / SMS Alerts සේවාව/ Whatsapp බැංකුකරණ පහසුකම
- විද්‍යුත් ප්‍රකාශන (E-statements)
- Visa Debit කාඩ්පත

ආරම්භක තැන්පතු හා ගාස්තු

නිමැවුම	Smart Freelancer	Smart Freelancer PFC **(පුද්ගලික විදේශ මුදල් ගිණුම)** / Smart Freelancer BFC/ **(ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම)**
කාණ්ඩය	ඉතුරුම්	ඉතුරුම්
මුදල් ඒකකය	ශ්‍රී ලංකා රුපියල්	**විදේශ මුදල් ඒකක** (එක්සත් ජනපද ඩොලර්-USD/ ස්ටර්ලින් පවුම්-GBP/යූරෝ-EUR/ ජපන් යෙන්-JPY/ කැනේඩියානු ඩොලර්-CAD / ඕස්ට්‍රේලියානු ඩොලර්-AUD/ සිංගප්පූරු ඩොලර්-SGD)
පොලී අනුපාතය	සාමාන්‍ය ඉතුරුම් අනුපාතය + 1%	PFC/BFC සාමාන්‍ය පොලී අනුපාතය + අදාළ අනුපාතයෙන් 10%
ආරම්භක තැන්පතුව	Rs. 2,500/-	ආරම්භක තැන්පතුවක් අවශ්‍ය නොවේ
අවම ශේෂය	Rs. 1,500/-	නැත
ගිණුම වසාදැමීමේ ගාස්තු	Rs. 500/-	එජඩො 5 හෝ ඊට සමාන මුදලක්

ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න.

- **Taxes -** බදු - පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.

සුදුසුකම

- පිළිගත් online මාධ්‍යය ඔස්සේ freelancing කටයුතුවල නිරතවන සහ/ හෝ බැංකුවට පිළිගත හැකි online ව්‍යවසාය කටයුතු වල (Ex: Fiverr, Freelancer.com, Upwork, YouTube and similar reputed platforms) නිරතවන අවුරුදු 18ට වැඩි තැනැත්තන් උදෙසා ගිණුම් විවෘත කළ හැකිය.

- **Smart Freelancer** ගිණුම ශ්‍රී ලංකාවේ නේවාසික ශ්‍රී ලාංකිකයන් හට විවෘත කළ හැකිය.
- **Smart Freelancer PFC** ගිණුම ශ්‍රී ලංකාවේ නේවාසික නොවන ශ්‍රී ලාංකිකයන් හට විවෘත කළ හැකිය.
- **Smart Freelancer BFC** ගිණුම ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයන් සඳහා සේවා සැපයීම හරහා විදේශ විනිමය උපයන ශ්‍රී ලාංකික නේවාසික පුද්ගලයන් හට විවෘත කළ හැකිය.

- තනි පුද්ගල ගිණුම් පමණක් විවෘත කළ හැකිය. බද්ධ ගිණුම්වලට අවසර නොලැබේ.

ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර

➢ **නේවාසික අයදුම්කරුවන් සඳහා -**

- ජාතික හැඳුනුම්පතේ (NIC)/ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්;
- දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන;
- ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග,

ඉතිරිකිරීමේ ගිණුම් විවෘතකිරීමේ අයදුම්පත සම්පූර්ණ කර ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.

අනේවාසික අයදුම්කරුවන් සඳහා -

- අයදුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුවේ පිටපතක්

ප්‍රධාන නියමයන් හා කොන්දේසි

- පාස්පොත් නිකුත්කරනු නොලැබේ.
- ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් තම අභිමතය පරිදි නාමිකයා/ නාමිකයන් නම්කළ යුතුය.
- මෙම නිමැවුමේ යම් කොන්දේසියක් සහ/ හෝ ඒ සඳහා පිරිනමන පහසුකමක් වෙනස්කිරීමට, එකතුකිරීමට හෝ ප්‍රතිශෝධනය කිරීමට ලංකා බැංකුවට බලය ඇත.
- නිමැවුමට අදාළ සියලු නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

			- වලංගු වීසා බලපත්‍රයේ පිටපතක් හෝ විදේශ රැකියාවක් කරන බව සනාථ කරන ලේඛනගත සාක්ෂි ➢ ස්වයං ප්‍රකාශන ආකෘති පත්‍රය (බැංකු ආකෘති) ➢ අදාළ මාර්ගගත ක්‍රමය ඔස්සේ රැකියාවේ නියුතුවන බව සනාථකරන සහ මුදල් ලැබීමේ මූලාශ්‍රවල ලිපිලේඛන/ තොරතුරු (උදා: ගිවිසුමේ පිටපතක්, email තහවුරුකිරීම්, ඉපැයීම් රිසිට්පත්, ඉපැයීම් ප්‍රේෂණය දක්වන බැංකු ප්‍රකාශ, මාර්ගගත ක්‍රමය/ ක්‍රම තුළ ඇති අයදුම්කරුගේ විස්තර (profile)	

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා ප්‍රමුඛතාව පදනම් කොටගෙන සලකා බලනු ලැබේ.
- **දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk **තැපැල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු , 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.
- අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.